

# විකසිත

2023 ජූනි
1 වන කාණ්ඩය
2 වන කලාපය

විද්‍යුත් කාව්‍ය සඟරාව

## පන්හිඳට පෙම් බඳින විහඟුන්ගේ ආමන්ත්‍රණය



දන්කොටුව ප්‍රාදේශිය ලේකම් කාර්යාලයට අනුබද්ධ
සංස්කෘතික බලමණ්ඩලයේ මාධ්‍ය අංශයේ ප්‍රකාශනයකි

# විකසිත

සඟරා සම්පාදක
නුවන්ති හංසිනී උත්පලා


සඟරා සංස්කාරක
ජයතිලක සෙනෙවිරත්න

පරිගණක අක්ෂර සංයෝජනය
නුවන්ති හංසිනී උත්පලා

කංචුක නිර්මාණය
සසිඳු රන්මිත්

පිටු සැකසුම
නුවන්ති හංසිනී උත්පලා

ඡායාරූප
වාසනා අනුරාධි
ආශා දිල්හානි




දන්කොටුව සංස්කෘතික
බලමණ්ඩලය

ප්‍රධාන අනුශාසක
ආචාර්ය පූජ්‍ය මැදවච්චියේ
විමලධම්ම හිමි

ප්‍රධාන විධායක සභාපති
විජානි වසන්තිකා
( ප්‍රාදේශීය ලේකම් )

සභාපති
ඒ. එම්. ධම්මික ගුණරත්න

උප සභාපති
ඩී. එම්. කපිල දිසානායක

ලේකම්
පී. ඩී. කාන්ති රම්‍යලතා

උප ලේකම්
නුවන්ති හංසිනී උත්පලා

භාණ්ඩාගාරික
සිඩ්නි  රෝහණ අප්පුහාමි

මාධ්‍ය අංශය
නුවන්ති හංසිනී උත්පලා

2023 ජූනි කලාපය

# විකසිත

# පටුන


මහපොළොවේ පැළවෙන කවිය - වාසනා අනුරාධි

කලාවට ළැදි සිත කැලෑවට නොයයි - දීපා චාන්දනී

ප්‍රථම ප්‍රේමය - ජයතිලක සෙනෙවිරත්න

පුස්තකාලෙ තනිවෙලා - නුවන්ති හංසිනී උත්පලා

හාමිනේට - සුරේෂ් කුමාර

ආදරය - විමලසිරි අත්තනායක

වේයෙක් දැක තුටු වී - හරසර පීරිස්

පියාණෙනි - නිමේෂා මදුශානි

වැසීමට පා යුගලක් - මිත්මා භාෂිණී ජයසිංහ

අඳුරු බක්මහා - සසිඳු රන්මිත්

අසම්මතය - මිතුනි යසාරා

මදුරුවා - පූජානි මල්ෂා

නැත ඇයට කළ නොහැක්කක් - නඳුනි කවීශා

පිරිමි - යශෝදනී ජයසිංහ

සොබාදහමෙන් - සුභානි රත්නායක

කවි මිණි මුතු වැඩසටහන




# විකසිත

## සංස්කාරක සටහන

**විකසිත** දෙවන කලාපය මෙසේ එළි දැක්වීමට හැකිවීම පිළිබඳ ව අපගේ බලවත් සතුට ප්‍රකාශ කරනු කැමැත්තෙමි. එය බොහෝ දෙනෙකුගේ සාමූහික ප්‍රයත්නයක අග්‍ර ඵලය ලෙස හඳුනා ගතිමි. දන්කොටුව ප්‍රාදේශීය ලේකම්තුමිය , එහි සංස්කෘතික නිලධාරිනීන් මතු නොව සංස්කෘතික බලමණ්ඩලය මෙම සත් කාර්යයේදී ඉදිරියෙන් සිටියි. විශේෂයෙන්ම පරාර්ථය පෙරදැරිව මෙහි පරිගණක අක්ෂර සංයෝජනයෙන් කංචුක නිර්මාණයෙන් , පිටු සැකසීමෙන් නොමද දායකත්වය ලබා දුන් **නුවන්ති හංසිනී උත්පලා සහ සසිඳු රන්මිත්** හා සහෘද කලාකරුවන්ට කලාව වෙනුවෙන් කරන කැපකිරීම වෙනුවෙන් හෘදයාංගම ස්තූතිය පිරිනමනු කැමැත්තෙමි. පළවූ කලාපයේ දී මෙන්ම විකසිත වන්නට වෙර දරන අංකුර කවියන්ගේ නිර්මාණ සඳහා වැඩි අවකාශයක් ලබා දීමට කටයුතු කළෙමු. පළවූ කලාපයට වඩා නිර්මාණ රාශියක් අප වෙත ලැබී තිබුණි. එහෙත් ඉඩහසර පිළිබඳව ගැටලුව නිසා නිර්මාණ තේරීමක් කිරීමට සිදු විය. අපගේ ආදරණීය අංකුර කවියන් අධෛර්යයට පත් නොවී තව තවත් නිර්මාණකරණයෙහි යෙදී හොඳම නිර්මාණ අප වෙත එවීමට කටයුතු කරන ලෙස කාරුණික ව ඉල්ලා සිටිමි.

" විකසිත " තුළින් විශිෂ්ඨ කවි කිවිඳියන් රැසක් දන්කොටුව පුරවරයෙන් බිහිවේවායි ප්‍රාර්ථනා කරමි.



-සංස්කාරක-

# මහපොළොවේ පැළවෙන කවිය



විශ්ව සාහිත්‍යයේ හො සිංහල සාහිත්‍යයේ පහළව ඇති කලා මාධ්‍ය අතර කාව්‍ය නම් වූ කලාව ඉපැරණිය. එමතු නොව කොයි කලෙකත් පැරණිය. රමණීය මනරංජනීය වන්නේම ය. විටෙක කර්තෘ නිශ්චිතය. විටෙක අවිනිශ්චිතය. ඒ කෙසේවෙතත් කවිය ඉදිරියට දෝලනය වේ. ලාංකීය ජන සංගීතය ගත් කළ එහි හමුවන ජන ගී රටාවන් නන්විධ වේ. එහෙත් කර්තෘවර නම් අවිනිශ්චිත ය. කෙසේ නමුත් පරපුරෙන් පරපුරට වාග් වින්‍යාසයෙන් පරිණාමය වෙමින් කවිය දෝලනය වී සුභාවිතයේ පවතී.

සිරිලක කාව්‍ය කලා ඉතිහාසයේ ප්‍රකට කවිසිළුමිණ , අමාවතුර හමුවෙන්නට පෙර කාව්‍ය කලාව හමුවන්නේ සීගිරි කැටපත් පවුරෙනි. භාති යනු පස්වෙනි සියවසේ මෙරට සිටි කිවිඳියක් නම් සීගිරි ලලනාවන් පිළිබඳව අනෙකුත් සියළුම කවි නිමවෙන්නේ සීගිරි කැටපත් පවුරෙනි .

අසමාන තේජසක් හොවාගෙන වැජඹෙන සීගිරි පර්වත කාන්තියේ බැබළුන සුන්දර ලියන් පිළිබඳව වර්ණනා කොයි කලෙකත් සිඳුකරන්නේ කවියන් නොව කිවිඳියන් නොවන්නේය. එබැවින් කවදා නමුත් කලාව ස්පර්ශ කරන්නට යෙදුනේ කිවිඳුන් ය. කවි නිර්මාණ විදීමේදී ප්‍රකටවන්නේ කිවිඳියන් අභිබවා කවීන් ගහන බවයි. කවි ඇස ප්‍රබලවන්නේ කවීන්ට බව මා හැඟීම්. අඟනුන් දැරූ රූසිරි වරුණා ගළපා කවි තනන්නට පෙළඹෙන කවීන් එම සෞන්දර්යය විඳින්නෝහු ය. විවිධ ප්‍රස්තුතයන් විඳීමෙන් තොර වූවෙක් තුළ සාර්ථක කවියක් නිර්මානය නොවන්නේමය. යමෙකුට වින්දනීය ප්‍රස්තුතයක් වෙත්ද සරලව කඩිනමින් ප්‍රකාශනයක් නිර්මාණය කළහැකි කලා මාධ්‍යයක් ලෙස කාව්‍ය කලාව හඳුන්වා දිය හැකිය.

වාසනා අනුරාධි
සංස්කෘතික නිලධාරි
දංකොටුව

# කලාවට ළැදි සිත කැලෑවට නොයයි



‘ කලාවට ළැදි සිත කැලෑවට නොයයි ‘ යන වදන හා බැඳුණු අපේ සූ සැට කලාවන් ඉදිරි පරපුරට දායාද කිරීම වත්මන් සමාජයේ වගකීමයි. තාක්ෂණය හා සන්නිවේදනය තුළින් ලබා ඇති දියුණුව සමඟ කලාව හා සාහිත්‍ය හැකියාව වත්මන් මිනිසා තුළින් සැඟවී ගොස් ඇති බව නොරහසකි.

එසේම කවර තරාතිරමක ජන සමාජයන් අතර සාමූහික හැඟීම් හා ක්‍රියාකාරකම් යටපත් වී ඒ වෙනුවට ඉස්මතු වී ඇත්තේ දැඩි ආශාවන් රුදුරුකම් ඇසුරෙහි වැඩෙන පුද්ගලවාදී සංකල්ප සහ ආත්මාර්ථකාමීත්වයයි. මෙවන් අසාරධර්මයන් යටපත් කරමින් සමාජය අතරින් ගිලිහුණු සාරධර්ම ස්ථාපනය කිරීම උදෙසා කලාවෙන් ලැබෙන්නා වූ පිටුවහල අද්විතීයයි.

මානව සන්තානගත ආතතීන් සුවපත් කර යහපත් සමාජ මෙහෙවරක යෙදෙන්නට කලාවට හිතැති පුද්ගල ක්‍රියාකාරිකයන්ට ( කලා ශිල්පීන්ට ) හැකියාව ලැබෙන්නේ ද මෙම සුවිශේෂී ධර්මතාවයන් කලාව තුළ ගැබ් වී ඇති නිසාය.

එමෙන්ම භෞතිකව සලකා බලන කළ දැනුමෙන් විද්‍යාවෙන් තාක්ෂණයෙන් පෝෂණය වී ඇති බව විද්‍යමාන වේ. වර්තමාන ලෝකයේ මිනිසුන් අතර මිනිසත් බවේ ගුණාත්මක හර පද්ධතීන් සහ ප්‍රතිමාන පද්ධතීන් බෙහෙවින් සෝදාපාළුවට පත් වී අභියෝගයට ලක් වී ඇත. මෙවැනි යුගයක කලාවේ සුන්දරත්වය තුළින් සුවපත් ලෝකයක් දැකීමේ පුනරාගමනය කලාව තුළින් ඇති කළ හැකි බව මගේ විශ්වාසයයි.

දීපා චාන්දනී
සංස්කෘතික නිලධාරිනී
දංකොටුව

# ප්‍රථම ප්‍රේමය



ප්‍රථම වසන්තය නිම වෙන්නට පෙර
ප්‍රථම ප්‍රේමයෙන් අපි සමු ගත්තෙමු
එදා මෙදා තුර ඇස නොගැසුණු බව
කොතැනක දෝ නො දනිමි ලඳුනේ

සුවඳ කැවූ පෙම්පත් සිහිවටන ද
සුමුදු වදන් නෙතුකැන් මදහස රැලි
පෙම් සිතිවිලි කිති කවමින් හදතුළ
සිහින විමානෙක දොරගුළු හැරියා

අතීත සැමරුම් නටඹුන් අතරේ
ඔහේ ඇවිද යම් හැරමිටි සරණින්
මා ද නො වන මම ඔබ ද නො වන ඔබ
අහක බලාගෙන එහි සිටියා

විජ්ජුලතාවගෙ සිරින් එදා ඔබ
දිවි මග මොහොතක් එළිය කළා
සොඳුරු මතකයකි පුදුමයි ඔබ අද
නන්නාඳුනනා කෙනෙකු වෙලා

ජයතිලක සෙනෙවිරත්න

# පුස්තකාලෙ තනිවෙලා



සුවඳ හමන පිටු එකතුව එක බැම්මෙන් බැඳිලා
පුස්තකාලෙ පොත් එකතුව රාක්කවල රැඳිලා
ඉස්සර නම් පොත් කියවන පිරිස හිටියෙ පිරිලා
කාන්සියට පොත්වලටත් දැන් නිදිමත හැදිලා

වැඩට යද්දි හවස එද්දි ඔළුව බිමට නැමිලා
නව පරපුර ෆෝන් එකට සත්තයි වහා වැටිලා
තාක්ෂණේ දියුණු වෙද්දි දෑතෙ ඇඟිලි ගෙවිලා
පොතෙන් පතෙන් ගත්ත දැනුම දන්නෙම නෑ හැලිලා

වර්තමාන පරපුර හට නෑ පොත් රස දැනිලා
සාමා අමරගෙ කතාව හිත්වලිනුත් මැකිලා
අත්ල මැද්දෙ ඩිජිටල් තිර මනෝලෝක මවලා
දරුවන්ගේ පුංචි මනස හොඳටම වල් වැදිලා

පුස්තකාලෙ පොත් රාක්කෙ තිබුණට පොත් පිරිලා
කියවන්නට නෑ කවුරුත් ඩිජිටල් රස වැටිලා
අනාගතේ ඉරණම ගැන පොත් කලින්ම දැකලා
පුස්තකාලෙ පොත් ඊයෙත් ඉකි ගහ ගහ අඩලා

නුවන්ති හංසිනී උත්පලා

# හාමිණේට



නිතරම එකම දෙය කියමින් කර වාද
මොකටද පවුල තුළ ඇති කර මතවාද
මින්පසු කිසිම විට නොකියමි අවලාද
මතු දියුණුවට අපි වැඩ කරමුද හාද

අපෙ යුග දිවිය ඇරඹුව ඒ මුල් කාලේ
අඟහිඟ කොතෙක් තිබුණද එක එක තාලේ
දුක සැප සමව විඳ නොගොසින් ගම් දෑලේ
සතුටින් සිටිය මතකද රැකගෙන සීලේ

වෙර වීරියෙන් පොඩියට අතු පැලක් තනා
මුළුතැන්ගෙයක් හැදුවෙත් මැටි ගොඩක් අනා
මව් පිය පදවි ලැබුවා මුළු ලොවක් දිනා
පුතු ගෙන ආවෙ ගෙපැලට කිරි සිඟිති සිනා

අපටත් නොදැන හිමිහිට කාලය ගෙවුණා
පොල් අතු වහලෙ අතරින් ඉර සඳ එබුණා
හිරිකඩ මැදින් සුළඟට පහන ද නිවුනා
නිදි පැඳුරටත් ඉඳහිට තනිකම දැනුනා

සුභ පෙර නිමිති දැක කඳුළක් වැටුණි ඇහේ
අඹ ගැට දොඩම් ගැට හනිකට පැසුණි ගහේ
සෝ දුක් පහව ගිය සතුටකි අපගෙ රැහේ
දූ කුමරියක් පිදුවා නුඹ ඇසළ මහේ

**සුරේෂ් කුමාර**

# ආදරය



හිමිදිරි උදෑසන ජවයකි ආදරය
හිස් කුස පිරෙන දිය බිඳුවකි ආදරය
මනසට උදේ අහර ද මේ ආදරය
වත මෙන් ගතට මනසට මේ ආදරය

වෙහෙසෙන ගතට පැන් පොද මේ ආදරය
දිවි රැකුමකට මෙහෙයකි මේ ආදරය
පෙම්බර යුවල එක් කළ මේ ආදරය
ජීවන ඔරුවෙ හබල යි මේ ආදරය

අඹු සැමි යුවළ රැකි පදනම ආදරය
ගුණ නැණ පිරුණු දරු බිහිකළ ආදරය
නිවහන සවිය සිරිකත නුඹ ආදරය
මහගෙය කැණිමඬල නුඹමයි ආදරය

ගමරට දියුණුවන පදනම ආදරය
ජාතිය භේද කුලමල නැති ආදරය
වපුරපු බීජ හැම හදකම ආදරය
ජයගමු ජීවිතය රැකගෙන ආදරය

විමලසිරි අත්තනායක

# වේයෙක් දැක තුටු වී



පොඩි සිරුරක් උනත් උස මිනිසෙකුගෙ මෙන
තම සිරුරේ උස හොඳ හැටි හැඳිනගෙන
ඒ වැනි සිය දහස් ගුණයක් උස් නිවෙස් නුඹ
තනනා අයුරු මහඟුය පුදුමය දකින

අඟලක පහෙන් එක උස් සිරුරක් ඇතිව
ජනපදයක් ලෙසින් සැම එක්වී සිටින
රැජිනකි රැහේ මුල් අසුනේ රැක ඉන්න
මේ සා වටින පෙදරේරුවො තව කොතැන

තම සිරුරේ පමණට බෝ ගුණ වන්න
හදලා නිවෙස් ඇත බෝ දෙනෙකුට ඉන්න
ජලයත් වාතයත් නිවසේ ගෙනයන්න
හැකි සේ නිමවලා ඇත යහමින් ඉන්න

සිසිලස පොළෝතලය පුරා පැතිරෙන්න
සිසිලකි පුදුම සිහිලකි ඇතුළෙත් දැනෙන
බොහො කුටි තිබේ ජනපද ඇයන් ඉන්න
මිනිසා පැරදු උස නිවසකි සැදි ඔන්න

හොඳහැටි වේයගේ වැඩ හරි සිත් ගන්න
පුහු මානයත් සිත් මානෙන් දුරලන්න
හැම දේ නැතිව යන බව හඳුනා ගන්න
එකතු කළත් දෙන දේ සතුටින් දෙන්න

හරසර පීරිස්



# පියාණෙනි

විසල් වූ ගුවන් තලයෙහි
පෑයූ සරා සඳ හට
සොමි රැසින් ලොව එළිය කරනට
දුන්නේ ඔබ නොවෙද හිරු කිරණ...

ලේ කිරි නොවුණත් ඔබේ සිරුරේ ඇති
කුස නොදැරුවත් දස මසක් මා
ලොවට වැඩියෙන් ණයගැතියි මා
පියාණෙනි ඔබ හට සදාකල්...

හිරුත් සමඟින් නුඹත් අවදිව
පියමැන්නේ දහඩිය හෙලන්නට
නමුත් මා හට නොවැටහුණි එය
ඔබේ රළු ගති පමණි දැනුනේ...

නමුදු ඔබගේ අසීමිත පෙම
දැනෙයි දැන්නම් අප්‍රමාණව
රකින්නම් මා ඔබව මතු දා
පියාණෙනි මගේ දිවිතුරා...

නිමේෂා මදුශානි

# වැසීමට පා යුගලක්



අටල්ලක ඉටි රෙදි කැබැල්ලකි
දවාලයේ රස්නයට පිච්චෙන
අඩි උසය , අඩි ගෙවුනු
ඉරී ගිය පාවහන්
කන්දක් ය
පිළිසකර කළ යුතු

ඇසිල්ලක විරාමෙක
ළමා පාවහනක් ය
හදවතට රිදුමක් ය

හෙට පිපිය යුතු
තවම නුපුබුදු
හීන ඇහැරවගන්න පතනෙමි
ඉතින් දාඩිය කැන් වගුවරවමි

රත්වෙලා සිසිල වන්නට කියා
ඉරත් දැන් අවරට ගියා
මමත් දැන් අකුලගෙන යනවා
ගෙන කිහිලිකරු දෙකක්
වාරු වී ගෙන සවියක්
නැතිව පා වහනකින්
වැසීමට පා යුගලක්

මිත්මා භාෂිණී ජයසිංහ

# අඳුරැ බක්මහා



ගුවනේ පාට කිමදැයි මම දැක නැත්තේ
සයුරේ රළත් කිසිදා මම දැක නැත්තේ
අවුරැදු සිරිය නැත කවදත් විඳගත්තේ
තවමත් කොහෝ හඬ ඇයි ඇසුනේ නැත්තේ

ගංඟා කෙත්වතුත් තියෙනා මගේ ගම
සොඳුරැය අසා ඇත්තෙමි එය නොදුටු මම
අඳුරේ පිබිද අඳුරෙම නිදියනවා මම
තාමත් අන්ධයෙක් අම්මේ පුංචි මම

නොපෙනෙන සිනිඳු බෝනික්කෝ මට ඇයිද
මියැදෙන තුරාවට මම අන්දම වෙයිද
අම්මා ගිය දාක මම මෙහි තනිවෙයිද
අවසන් දවසෙ හෝ ලොව දකිනට බැරිද

බක්මහා එළඹි බව මගෙ සවනට ඇසුණි
වෙනදා වගේ අවුරැදු සිරි නොම දැනුණි
කෝ ඒ රබන් හඬ තවමත් නොම ඇසුණි
මේ බක්මහත් මා හට අඳුරැව ගෙවුණි

සසිඳු රන්මිත්

# අසම්මතය



පතා ආ ප්‍රේමයම දිවිය හොබවා මාරු
ගොතා මදහස ඉතින් තැබූ පය වෙයි සීරු
සිතා සැනසුම ලැබෙයි හදම ගෑවා පෝරු
ලිය මඩලකියි සිතු සිත නොවේ දැන් වාරු

මිණී මෙවුල බිඳී ගොස් අසම්මත දොර හැර
විණී හෙරක් සිටියෙ නිති සිතම සොරකම් කර
පැණි පිරුණු මී වදයෙ කවුළු නොතිබුණි සිර
ඉකි ගසා වට කලද හිස පෙවුමටයි බර

කලේ කිරි උනත් දැන් දියවෙලා එහි ගොම
පලේ වේදැයි ඉතින් සෙනෙහසට නැත නිම
නිසල විල කැලඹිලා වතුර බොරවුණේ කිම
පිලේ පැඳුරත් නැතිය බිඳී සම්මතෙ ඉම

කේ. මිතුනි යසාරා

# මදුරුවා



දහවල් අහර මඟහැරුනා
මිනිසුන් අතර භය දැනුනා
අත්තටු හකුලගෙන තනියම
නිදි වැරූ දෑසක් සෙව්වා

හෙමින් සැලූ මගෙ අත්තටු
හිරි වැටෙනා බව දැනුනා
උලුක්කුවෙන් මගේ දෙපය
වෙව්ලා මං බිම වැටුනා

ඇඟිලි පහක් මැද සිරවුණු
මගෙ දෑසින් තරු විසිවුණි
දෙදරා ගිය ඒ සද්දය
බඩගිනි මගෙ නිමා කළා

ඇඟ මගෙ සීතල වීගෙන
යන අරුමය මට දැනුනා
ඇස් පියවීගෙන අවසන්
හුස්ම ළඟදී මට හැඩුනා

වරදක් කරන්නට නෑ මං සිතුවේ
ඔබට රිදවමින් නිකරුනෙ රාත්‍රියේ
උරමින් බොන්න ලේ උගුරක් ඔබේ අතේ
සිතුවේ ගින්න වැඩි හින්දයි මගේ කුසේ

පූජානි මල්ෂා

# නැත ඇයට කළ නොහැක්කක්



පීවිතය යනු සැබැවින්ම
මහ මෙරකි උසුලනු බැරි....
නමුත් එය අම්මෙකුට නම්
පාවී යන පිණි මලක්.....
දරුවන්ගේ හෙට දවස වෙනුවෙන්
ඈ විදි දුක් කප්පරක්.....
දරුවන් සක්විති කරන්නට
ඇයට ඇත යෝධ බල ශක්තියක්.....
අද දවස කැප කරන අපම වෙනුවෙන්
හෙට තනන ඈ දෙව්ලියක්.....
අපේ හෙට දවස වෙනුවෙන්
නැත ඇයට කළ නොහැක්කක්.....

එච්. කේ. ඒ. නඳුනි කවීශා

# පිරිමි



රැහිරු හැඩි දැඩි ගතට හැංගුන
ළපටි මුදු වූ ගැහෙන හදවත
මහා විසකටු ඇනී රිදුනද
නැහැලු අවසර කඳුළු ඇසකට

පිරිමි හිත් හරි රළුයි
කවුරු කවුරුත් කියනු ඇසුනා
ඉවසීම් ගති කොයින් ද උන් හට
නපුරුකම උන් අරන් ඉන්නා
පෙමට නොව රාගයට උන් ලොල්
එහෙව් ලෝකෙක සෙනේ පියවරු
බිහිවුණේ කෙලෙසකද සිතුණා

යශෝදනී ජයසිංහ

# සොබාදහමෙන්



සැඬ හිරු කිරණ මහ පොළොවට වැටෙන විට
මද මුදු සුළඟ දෙන සිසිලස අවට සිට
බැස යන ගඟුල දියරැළි මත පෙරැළි කොට
නෙත සිත සතුට තුළ කිම්දෙන අයුරු දුට

ගහකට වෙළෙන වැළකට ඇති සුවය පිට
නැළවෙන ළදලු කොදුරති කවි පසෙක සිට
හිනැහෙන පිපුණු මලකට සිත තුරුළු කොට
සුවඳම උරම් කුමකට අවසරය මට

කඳු මුදුනත වෙහෙස විඳගෙන හඬන විට
එහි පද මුළ සොඳුරු සෙවණැලි ඇදෙනු දුට
වැහිලිහිණිය තනිව මැසිවිලි නඟන විට
අළු පැහැ ඝන කුළු ද හෙම්හිට බිමට බට

පොද පොද වැටෙන දිය බිඳුවල පහස පිට
ගිනි ගෙන දැවුණු මිහිළිය ළඟ දුටිම් තුට
රිසි ලෙස අවැසි කල පිහිටට පැමිණි විට
ඇති සුව රැඳිය යුතුමය හද මඬල යට

සුභානි රත්නායක

# විකසිත

## කවි මිණි මුතු

### කවියට සවියක් වෙමින් කවි මිණි මුතු සොයා ගිය චාරිකාවේ පළමු දිනය





**2023.05.24**

**දන්කොටුව බාලිකා විදුහල**

# විකසිත

## කවි මිණි මුතු

### කවියට සවියක් වෙමින් කවි මිණි මුතු සොයා ගිය චාරිකාවේ පළමු දිනය





## 2023.05.24
## දන්කොටුව බාලිකා විදුහල

# විකසිත

කවි මිණි මුතු

## කවියට සවියක් වෙමින් කවි මිණි මුතු සොයා ගිය චාරිකාවේ දෙවන දිනය





**2023.05.31**

**ප්‍රාදේශීය ලේකම් කාර්යාලය**

**දන්කොටුව**

# විකසිත

## කවි මිණි මුතු

### කවියට සවියක් වෙමින් කවි මිණි මුතු සොයා ගිය චාරිකාවේ දෙවන දිනය

**දරුවන් අදහස් දක්වමින්**





**2023.05.31**

**ප්‍රාදේශීය ලේකම් කාර්යාලය**

**දන්කොටුව**